සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

52 S I

පළමු වාර පරීක්ෂණය - 13ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 13 -2020**

විභාග අංකය ................................. නර්තනය (දේශීය) I කාලය පැය දෙකයි

වැදගත්

අංක 01 සිට 25 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහනෙහි යොදන්න.

- **උපදෙස් : මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 100 කි.**

01. මරගන වන්නම, සිරිකත වන්නම, සමන් දෙව්රද වන්නම යන නවතම වන්නම් රචනා කරන ලද්දේ,
   1. තිස්ස කාරියවසම් මහතා, ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය සහ ජයසේන කෝට්ටේගොඩ මහතාය.
   2. මුදියන්සේ දිසානායක මහතා, ජයසේන කෝට්ටේගොඩ මහතා සහ ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය.
   3. මුදියන්සේ දිසානායක මහතා, ආරියරත්න කළු ආරච්චි මහතා, ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය.
   4. ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය, ජයසේන කෝට්ටේගොඩ මහතා සහ මුද්‍යන්සේ දිසානායක මහතාය.
   5. ආරියරත්න කළුආරච්චි මහතා, මුදියන්සේ දිසානායක මහතා සහ ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය. (........)

02. ලී මල්ලිය, ගොයම් නැටුම හා කුළු යන සිංහල ගැමි නැටුම්වලට සමාන ද්‍රවිඩ ගැමි නැටුම් වන්නේ,
   1. කෝලාට්ටම්, අරිච්චෙට්ටු සහ සුලකුය
   2. අරිච්චෙට්ටු, කෝලාට්ටම් සහ චෙම්බු
   3. පින්නල් කෝලට්ටම් අර්ච්චෙට්ටු සහ සුලකුය
   4. පින්නල් කෝලාට්ටම්, චෙම්බු සහ සුලකුය
   5. පින්නල් කෝලාට්ටම්, සුලකු සහ කුම්මිය (........)

03. ගත ගුම් ර්......... රිම්ගත ගදිගත ගදිත ගනම් ............... යන පදයෙන් සභාවට පිවිසෙන කෝලම් චරිතය වන්නේ,
   1. නොංචිය 2. ජසයාය 3. ලෙන්චිනාය
   4. මුදලිය 5. අණබෙරකරුය (........)

04. '' සැදු සැටි පුවතරා - පොකුරු බෙරයැයි සැදුනි එවරා'' මෙම කවි පදයෙන් දැක්වෙන පොකුරු බෙරය යනුවෙන් හඳුන්වන්නේ
   1. තම්මැට්ටමයි 2. මිහිඟු බෙරයයි 3. ගැවුලයි
   4. දෙවොල් බෙරයයි 5. තබ්බෝරුවයි (........)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

05. ශෘංගාර, රෞද්‍ර, අද්භූත යන රසයන්ගෙන් නිෂ්පන්න වන භාව වන්නේ,

1. රතී, ක්‍රෝධ සහ උත්සහයයි 2. රති, ක්‍රෝධ සහ විස්මයයි 3. හාස්‍ය, භය සහ විස්මයයි

4. රති, ක්‍රෝධ සහ ජුගුප්සායයි

5. කරුණා, ක්‍රෝධ සහ විස්මයයි (........)

06. පොළොන්නරු යුගයේ නර්තන කලාව හා සබැඳි රූකම් දැකිය හැකි වන්නේ,

1. ගලපාත විහාරය, ලෝවාමහාපාය සහ සැටදාගේය

2. සැටදාගෙය, ලෝවාමහාපාය සහ ඇම්බැක්කේ දේවාලයේය

3. දැදිගම සූතිඝර චෛත්‍ය, පොළොන්නරු වටදාගෙය සහ සැටදාගේය

4. ගලපාත විහාරය, ලෝවාමහාපාය සහ වටදාගේය

5. දැදිගම සූතිඝර චෛත්‍ය, ලෝවාමහාපාය සහ ගලපාත විහාරයේය (........)

07. බලියාගයේදී ඇදුරාගේ වම් අතට සහ දකුණු අතට ගනු ලබන්නේ පිළිවෙලින්,

1. අත්මිණිය සහ පන්දමය. 2. අත්මිණිය සහ පුවක්මල් කිනිත්තය.

3. පන්දම සහ පුවක්මල් කිනිත්තය. 4. අත්මිණිය සහ ඊ ගසය.

5. අත්මිණිය සහ පොල් පන්දමය (........)

08. රත් පැහැයෙන් යුත් වානරයකුගේ මුහුණට සමාන වෙස් මුහුණක් පළඳින්නේ,

1. කළු යකාය 2. ඊරි යකාය 3. කෝලයකාය

4. මරුයකා ය 5. සූනියම් යකාය (........)

09. ''සුගත් දහම් සඟ රත්නේ වැදිල්ලා'' මෙම කවි පාදය

1. උඩැක්කි කවියකි 2. පන්තේරු කවියකි 3. රබන් කවියකි

4. වරම් කවියකි 5. සූවිසි විවරණ කවියකි (........)

10. ඒ වෛදේහ රජුගේ විධානයෙන් ආතත, විතත, විතතාත, ඝන, සුසිරය යනාදී පංචවාර්ගික තූර්ය ...... නාද පැවැත්වූහ යන්නෙන් සඳහන් වන්නේ,

1. දඹදෙණි යුගයේ රචිත කව් සිළුමිණේ ය.

2. දඹදෙණි යුගයේ රචිත සද්ධර්මරත්නාවලියේ ය.

3. කුරුණෑගල යුගයේ රචිත සිංහල ථූප වංසයේ ය.

4. කුරුණෑගල යුගයේ රචිත උම්මග්ග ජාතකයේ ය.

5. කුරුණෑගල යුගයේ රචිත දළඳා සිරිතේ ය. (........)

11. පහතරට සහ සබරගමු නර්තන සම්ප්‍රදායන්ට අයත් නර්තන අංග පිළිවෙළින්,

1. මුල් මාත්‍රය සහ පට්ටුනාල් මාත්‍රය වේ.

2. ශුද්ධ මාත්‍රය සහ මුල්මාත්‍රය වේ.

3. ශුද්ධ මාත්‍රය සහ සින්දු මාත්‍රය වේ.

4. පට්ටුතාල් මාත්‍රය සහ තිත් මාත්‍රය වේ.

5. ශුද්ධ මාත්‍රය සහ තිත් මාත්‍රය වේ. (........)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

12. කුන්දිරම්පල්ල, වලයම, කෙයිපුඩිවලල්ල යොදා ගනු ලබන අවනද්ධ භාණ්ඩ වන්නේ,

1. ගැටබෙරය, උඩැක්කිය හා දෙවොල් බෙරය
2. තම්මැට්ටම, දවුල සහ උඩැක්කිය
3. ගැටබෙරය, තම්මැට්ටම සහ දවුලය
4. දවුල, තම්මැට්ටම සහ උඩැක්කිය
5. තම්මැට්ටම, උඩැක්කිය සහ ගැටබෙරය (........)

13. පිළිවෙලින් උඩරට පහතරට සහ සබරගමු ශාන්තිකර්මවලට අයත් නාට්‍යයමය අවස්ථා වන්නේ,

1. පොත්කඩේ යක්කම, දරුනැලවිල්ල, කෝල්පාඩුවය.
2. අඹ විදමන, අසුරයක්කම, ගුරුගේ මාලාවය.
3. උඟරා යක්කම, නානුමුරය, පොත්කඩේ යක්කමය.
4. උඟරා යක්කම, අඹ විදමන, ගුරුගේ මාලාවය.
5. ගුරුගේමාලාව, හාතායක්කම, අඹ විදමනය. (........)

14. සෙල්මුවා වා කවුළුවක ඉන්දියානු භරත නාට්‍යකරණ විලාසයක් කැටයම් කර ඇත්තේ,

1. රිදී විහාරයේ ය
2. ලෝවාමහාපායේ ය
3. ගඩලාදෙණිය විහාරයේ ය
4. යාපහුව දළදා මාලිගාවේ ය
5. ඇම්බැක්කේ දේවාලයේ ය (........)

15. මිනිස් කරවට ප්‍රමාණයේ උස පේකඩ සහිතව සකස් කර ගන්නා සැරසිල්ල දැකිය හැක්කේ,

1. මල් යහනාවේ ය.
2. කිරිමැස්සේ ය.
3. ගවරමලේ ය.
4. රටයකුම් වීදියේ ය.
5. සොළොස් මගලේ ය. (........)

16. ''නිරිත කොන යුතා මල් මල් සුවඳැති වැටකෙ වනවෙතා'' මෙම කවියෙන් කියවෙන්නේ,

1. කුජ ග්‍රහයා පිළිබඳවය.
2. සිකුරු ග්‍රහයා පිළිබඳවය.
3. රාහු ග්‍රහයා පිළිබඳවය
4. හිරු ග්‍රහයා පිළිබඳවය
5. බුද ග්‍රහයා පිළිබඳවය (........)

17. කෝලම් නාටකයේ එන මුදලි කෝලම හා සම්බන්ධ අනෙකුත් චරිත වන්නේ,

1. නොංචි, හෙන්චප්පු සහ අප්පුහාමිය
2. ජසයා, අප්පුහාමි සහ ඩුංගුරුවාය
3. පරයා, හෙන්චප්පු සහ ලෙන්චිනාය
4. වුක්කිනියා, හෙන්චප්පු සහ වෙදරාලය
5. ජසයා, හෙන්චප්පු සහ අප්පුහාමිය (........)

18. නර්තන කලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු විමසීමේදී කොරවක්ගල පාලමොට්ටායි යන සෙල්ලිපි අයත් වන්නේ,

1. දඹදෙණි සහ පොළොන්නරු යුගයට ය.
2. අනුරාධපුර සහ පොළොන්නරු යුගයට ය.
3. පොළොන්නරු සහ කුරුණෑගල යුගයට ය.
4. අනුරාධපුර සහ යාපහු යුගයට ය.
5. දඹදෙණි සහ කුරුණෑගල යුගයට ය. (........)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.
NWP - EXAM

19. කාන්තා ලෙඩරෝග නිවාරණය සඳහා උඩරට, පහතරට සහ සබරගමු සම්ප්‍රදායන්වල පවත්වනු ලබන ශාන්තිකර්ම වන්නේ,

1. කඩවරකංකාරිය, රිද්දියාගය සහ කුමාර සමයම ය.
2. කුමාර සමයම, රිද්දියාගය සහ මහසොහොන් සමයම ය.
3. කඩවරකංකාරිය, ගරායකුම සහ රිද්දියාග ය.
4. රිද්දියාගය, මහසොහොන් සමයම සහ කඩවරකංකාරි ය.
5. ගරායකුම, කුමාර සමයම සහ රිද්දියාග ය. (........)

20. ''ගතත් රත්පැහැ සිව් අතින් සැදි රකුසු විලසින් බබළනා'' යන කවිය අයත් වන්නේ,

1. ග්‍රහ පංති කවිවලටය 2. හීං හතරේ කවිවලටය 3. සූවිසි විවරණ කවිවලටය
4. ඇඹුම් කවිවලටය 5. කඩතුරා කවිවලටය (........)

21. කථක් නර්ථනයේ ටුකඩා පරන් යන නර්තන අංග වේදිකාව මත නිර්මාණය කර ප්‍රදර්ශනය කළේ,

1. බිර්ජු මහාරාජ්ය 2. කල්කා ප්‍රසාද්ය 3. නවාබ් වජිද් අලීෂාය
4. අච්චන් මහාරාජ්ය 5. මහා අක්බාර් රජුය (........)

22. සොළොස්මඟල, පහළොස්මඟල සහ මුවමල යන සැරසිලි දක්නට ලැබෙන්නේ,

1. කොහොඹාකංකාරි ශාන්තිකර්මයේ ය 2. වලියක් මංගල්‍යයේදී ය 3. රිද්දියාගයේදී ය
4. බලිශාන්ති කර්මයේදී ය 5. සන්නියකුමේදී ය (........)

23. ශානිතිකර්ම හා සම්බන්ධ සැරසිලි කිහිපයක් පහත දැක්වේ.



ඉහත ඡායාරූපවලින් දැක්වෙන්නේ පිළිවෙලින්,

1. අයිලය, මහසොහොන්වීදිය සහ රටයකුම් වීදිය වේ.
2. මහසොහොන්වීදිය, අයිලය සහ කිරිමැස්ස වේ.
3. අයිලය, මල් යහනාව සහ රටයකුම්වීදිය වේ.
4. රටයකුම්වීදිය, අයිලය සහ මහසොහොන්වීදිය වේ.
5. සූනියම්වීදිය, රටයකුම් වීදිය සහ මහසොහොන් වීදිය වේ. (........)

24. රංග වින්‍යාසය සහ අවකාශ භාවිතය අතර අනෝන්‍ය සබඳතා ගොඩනැගෙන්නේ,

1. අවකාශය, තල හා දිසා සම්බන්ධතාවෙන්ය.
2. චලනය, අවකාශය තල හා දිසා සම්බන්ධතාවෙන්ය.
3. තල, වේගය, දුර සහ ශක්තිය සම්බන්ධවීමෙන්ය.
4. ශක්තිය, කාලය, දුර සම්බන්ධවීමෙන්ය.
5. අවකාශය, චලනය, කාලය හා දුර සම්බන්ධතාවෙන්ය. (........)

25. දේශීය නර්තනයේ භාවිතා වන මාත්‍රා 4 (මහ තනි තිත) තාලයට සමාන කර්ණාට තාලය සහ හින්දුස්ථානි තාලය වන්නේ,

1. ත්‍රිශ්‍ර ජාති ඒක තාල සහ දාදරා තාලය ය.
2. චතුශ්‍ර ජාති ඒක තාල සහ ඣප් තාලය ය.
3. චතුශ්‍ර ජාති ඒක තාල සහ දීප් චන්දි තාලය ය.
4. චතුශ්‍ර ජාති ඒක තාල සහ ත්‍රිතාල් තාලය ය.
5. ත්‍රිශ්‍ර ජාති ඒක තාල සහ කෙහෙර්වා තාලය ය. (........)

- **26 -35 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

26. සුවඳමල් අමාත්‍යාගේ නැටුම අයත් වන්නේ ..................................................... ශාන්තිකර්මයට ය.

27. විභාව, අනුභාව හා ව්‍යාභිචාරි භාව සංයෝගයෙන් ..................................................... සිදු වේ.

28. ශබ්දම්, වර්ණම් සහ තිල්ලානා යන නර්තන අංග ..................................................... නර්තන සම්ප්‍රදායට අයත්ය.

29. රිද්දියාගයේදී නායක බිසව් වෙනුවෙන් සකස් කරන තොරණ ..................................................... තොරණ ලෙස හැඳින්වේ.

30. වලියක් මංගල්ලයේ දී යක්දෙස්සන්ගේ නළල මත ..................................................... විශේෂත්වයකි.

31. ගව පට්ටිවලට ඇතිවන්නාවූ රෝග පීඩා ආදියෙන් ආරක්ෂා කරගැනීමට ..................................................... ශාන්තිකර්මය පවත්වනු ලබයි.

32. ධා ධිං ධා ධා ධිං තා තිං ධා ධා ධිං

යන හිංදුස්ථානි තාලය දේශීය තාල පද්ධතියෙහි ..................................................... සමාන වේ.

33. තම්මැට්ටම වාදනයට හුරුවීමට භාවිතා කරන සරල උපකරණය ..................................................... නමින් හඳුන්වයි.

34. මහා පරාක්‍රමබාහු රජතුමා කාව්‍ය ශාස්ත්‍ර ගීත නැටුම් ඉගෙන ගත් බව සහ කාව්‍ය ශාස්ත්‍ර ගී. ආදියට මහත් සේ ඇලුම් කළ බව ..................................................... සඳහන් වේ.

35. නවතම වන්නම් නිර්මාණයේ දී 19 වන වන්නම ලෙස නම් කොට ඇත්තේ ප්‍රේම කුමාර එපිටවලගේ ..................................................... වන්නමය.

- **අංක 36 - 50 තෙක් ප්‍රශ්නවලට අදාල පිළිතුරු තිත් ඉරමත ලියන්න.**

36. ''උපන් පළමු එක්වර ඇති කරපු මවු මරා'' යන කවියෙන් නිරූපිත චරිතය සහ ශාන්තිකර්මය නම් කරන්න.

1. චරිතය ..........................................................2. ශාන්තිකර්මය ..........................................................

37. ''මෙලෙසින් මල් මද දෙවියේ - යුධයට කොඩි බැඳ ඒවියේ'' මෙම කවිපදය ඇතුලත් නර්තන අංගය හා අදාල තිත් රූපය නම් කරන්න.

1. නර්තන අංගය .......................................................... 2. තිත් රූපය ..........................................................

38. ''පණ්ඩුකාභය රජ තෙමේ චිත්තරාජ නම් යක්ෂයා සමග සම අසුන්හි හිඳ දෙව් මිනිස් නැටුම් නටමින්'' යනුවෙන් සඳහන් වන මූලාශ්‍රය සහ යුගය ලියන්න.

1. මූලාශ්‍රය .......................................................... 2. යුගය ..........................................................

39. චරිත නිරූපණ කාර්යයේ දී සංචාරි චලන සහ ස්ථිතික චලන යනු කුමක්ද?

1. සංචාරි චලන .......................................................... 2. ස්ථිතික චලන ..........................................................

NWP-EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

40. භරත නාට්‍යම් සඳහා යොදා ගන්නා සංගීත සම්ප්‍රදාය හා ප්‍රධාන අවනද්ධ භාණ්ඩය ලියන්න.

1. සංගීත සම්ප්‍රදාය ..................................................................................................................

2. අවනද්ධ භාණ්ඩය ..................................................................................................................

41. ''තෙල් ගාලා හිස පීරන් නෑනෝ'' මෙම ගී පදය මාත්‍රා 4 තාල රූපයට අනුව ගැයිමේදී ඊට අයත් සදැස්මක් හා ගීමත් ගණන කීයද?

1. සදැස්මක් ගණන ..................................................................................................................

2. ගීමත් ගණන ..................................................................................................................

42. නවීන අංග රචනා ක්‍රම දෙක ලියන්න.

1. .................................................................. 2. ..................................................................

43. ආධුනිකයෙකු බෙර සරඹ වාදනයට පෙර ප්‍රථමයෙන් වාදනය කරනු ලබන පද විශේෂය සහ මූලික බීජාක්ෂර සතර ලියන්න.

1. ප්‍රථමයෙන් වාදනය කරන ලද ..................................................................................................

2. මූලික බීජාක්ෂර සතර ..................................................................................................

44. ''ඉනේ හවඩි රන් කෙදිවන් - පයේ ගිගිරි වළලු ලවන්''

මෙම ගායනය අයත් නර්තන අංගය හා ශාන්තිකර්මය නම් කරන්න.

1. නර්තන අංගය ..................................................................................................................

2. ශාන්තිකර්මය ..................................................................................................................

45. කථකලී නර්තනය සහ මනිපුරි නර්තනය ප්‍රධාන නර්තන සම්ප්‍රධායක් ලෙස ස්ථාපිත කිරීමට පුරෝගාමී වූවන් නම් කරන්න.

1. කථකලී නර්තනය ..................................................................................................................

2. මනිපූරි නර්තනය ..................................................................................................................

46. පටාචාරා කලාකෘතිය නිර්මාණය කළ ශිල්පිනිය සහ ප්‍රථම වරට වේදිකා ගත කළ රඟහල නම් කරන්න.

1. ශිල්පිනිය ..................................................................................................................

2. රඟහල ..................................................................................................................

47. කාවඩිය මගින් සංකේතවත් කරන කඳු දෙක නම් කරන්න.

1. .................................................................. 2. ..................................................................

48. භරතමුනි විසින් හඳුන්වා දී ඇති නාට්‍ය ප්‍රභේද දෙක නම් කරන්න.

1. .................................................................. 2. ..................................................................

49. වෙස් මෝස්තර රචනයේ ප්‍රධාන කොටස් දෙක ලියන්න.

1. .................................................................. 2. ..................................................................

50. රසභාව පිළිබඳව අදහස් දැක් වූ පෙරදිග හා අපරදිග මතවාදීන් දෙදෙනෙක් නම් කරන්න.

1. පෙරදිග ..................................................................................................................

2. අපරදිග ..................................................................................................................

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

52 S II

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 13 - 2020**

විභාග අංකය .................................. නර්තනය (දේශීය) II කාලය පැය තුනයි

වැදගත්

I වන කොටසෙහි 1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ. II, III, කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින් ඇතුලත් වනසේ ප්‍රශ්න තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ.

## I කොටස

01. i. මංගලම් නර්තන අංගයට අදාළ බෙර පදය සහ කවි පදයක් ප්‍රස්තාර කරන්න.
ii. පහත සඳහන් කවි පද මාත්‍රා 2 +4 තාල රූපයට ප්‍රස්තාර කරන්න.
**අක්ක ඉතින් නාඩන්නේ**
**එක්ක ගොසින් අප එන්නේ**
iii. උකුසා වන්නමට අදාල අඩව්ව නිවැරදි තාල රූපයට ප්‍රස්තාර කරන්න.

02. දේශීය නර්තන කලාවේ විකාශනය කෙරෙහි විවිධ වූ සාධක බලපා ඇති බව එහි ඓතිහාසික තොරතුරු අනාවරණය කරයි.
i. විවිධ අවශ්‍යතා සඳහා බෙර වාදනය යොදා ගෙන ඇති බවට අනුරාධපුර යුගයෙන් සාධක දෙකක් ඉදිරිපත් කරන්න.
ii. ඓතිහාසික සෙල්ලිපි තුළින් නර්තන කලාව පැවති තත්වය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
iii. පොළොන්නරු යුගයේ නර්තන කලාවේ වර්ධනයට රාජ්‍ය අනුග්‍රහය ලැබුණු බවට සාධක හතරක් ඇසුරෙන් විමසන්න.

## II කොටස

03. සාම්ප්‍රදායික වශයෙන් ශාන්තිකර්මවල අරමුණු චාරිත්‍ර විධි මෙන්ම රංග උපකරණ සකස් කිරීම ද සුවිශේෂ අනන්‍ය ලක්ෂණ වලින් යුක්තය.
i. කිරිමඩුව ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු පැහැදිලි කර එහිදී පුද පෙත් දෙන දේව සමූහය නම් කරන්න.
ii. වළියක් මංගල්‍යය ශාන්තිකර්මය හා බැඳුණු චාරිත්‍ර විධි තුනක් නම් කර එහි අනන්‍ය ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කරන්න.
iii. විසිතුරු කැටයමින් යුත් රංග උපකරණ භාවිතය රටයකුම ශාන්තිකර්මය තුළ දැකිය හැකිය. නිදසුන් සහිතව විස්තර කරන්න.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

04. ශාන්තිකර්මවල පුද පූජාවන් පිළිවෙත් වලට මෙන්ම වාදන, සැරසිලි හා රංග වස්ත්‍රාභරණ භාවිතයට ද ප්‍රමුඛතාවයක් හිමි වේ.
   i. ශාන්තිකර්ම අතර බලි ශාන්තිකර්මයේ සැරසිලි අවස්ථා වෙනස් මුහුණු වරක් ගනී. පැහැදිලි කරන්න.
   ii. සන්නියකුම ශාන්තිකර්මයේ රංග වස්ත්‍රාභරණ භාවිතය ප්‍රස්තුතයට කොතෙක් ධූරට ගැලපේ දැයි පරීක්ෂා කරන්න.
   iii. විවිධ අවස්ථා පාදක කරගත් සුවිශේෂී බෙර වාදන සන්නියකුම ශාන්ති කර්මය තුළ දැකිය හැකිය. උදාහරණ සහිතව විස්තර කරන්න.

05. ගැමි නැටුම් හා ගැමි නාටක තුළින් සමාජීය ලක්ෂණ මෙන්ම ඒ ඒ සංස්කෘතීන්ට අදාළ ආගමික පසුබිම ද ප්‍රතියමාන වේ.
   i. සිංහල ගැමි නැටුම් වල ගායනා මගින් විදහා දැක්වෙන ගැමි ජීවන රටාවේ ඇදහිලි හා විශ්වාස නිදසුන් මගින් පහදන්න.
   ii. ජසයා, මුදලි හා නොංචි කෝලම් චරිත තුළින් පිළිඹිබු වන සමාජ විවරණය විග්‍රහ කරන්න.
   iii. සිංහල ගැමි නැටුම් හා ද්‍රවිඩ ගැමි නැටුම් අතර ඇති සමාන අසමානතා පිළිබඳ ඇගයීමක් කරන්න.

## III කොටස

06.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| ථුම්රි | දෘපට්ඨා | නිදි කුමරිය |
| ශබ්දම් | කොක්තුම්බි | කරදිය |
| වර්ණම් | ජාරි | බැරිසිල් |
| රාස්ලීලා | අට්ටියල් | පටාචාරා |

   i. (අ) කොටසේ සඳහන් මනිපුරි නර්තන අංගය නම්කර එම සම්ප්‍රධායේ ප්‍රභවය පිළිබඳ හැඳීන්වීමක් කරන්න.
   ii. (ආ) කොටසේ සඳහන් වන භරත සම්ප්‍රදායට අදාළ රංග ආභරණය තෝරා එම සම්ප්‍රදායට අයත් රංග වස්ත්‍රාභරණ පිළිබඳ විස්තර කරන්න.
   iii. (ඉ) කොටසේ දැක්වෙන බටහිර බැලේ නර්තන අංගය නම් කර එහි රංග රචනය අවකාශ භාවිතය පිළිබඳව දක්නට ලැබෙන සුවිශේෂතා ඇගයීමට ලක් කරන්න.

07. රූපවාහිනී ප්‍රාසාංගික නර්තන නිර්මාණකරනයේ දී රංග වින්‍යාසයෙහි මූලධර්ම පිළිබඳ අවබෝධය වැදගත් වේ.
   i. රංග වින්‍යාසය හා සබැඳි මූලික සංකල්ප විස්තර කරන්න.
   ii. නර්තන ශිල්පියෙකු තුළ තිබිය යුතු ඉන්ද්‍රීය සමායෝජනය පිළිබඳ පෙරදිග රසවාදීන් දක්වා ඇති මූලධර්ම පිළිබඳ විස්තර කරන්න.
   iii. රූපවාහිනිය මගින් විකාශනය වන නර්තන වැඩ සටහන් හතරක් නම් කර එම වැඩසටහන් රසඥතා වර්ධනයට බලපාන ආකාරය විචාරයට ලක් කරන්න.

08. අද්‍යතන ප්‍රාසාංගික නර්තන නිර්මාණකරණයේ දී අනුෂාංගි කලා භාවිතය විශේෂ වේ.
   i. චිත්‍ර කලාවේ මූලිකාංග හඳුන්වන්න.
   ii. ගීත නර්තන නිර්මාණකරනයට සංගීත කලාවෙන් ලැබෙන පිටිවහල විස්තර කරන්න.
   iii. නර්තන සඳහා රංග වස්ත්‍ර නිර්මාණයේදී භාවිත ශිල්ප ක්‍රම පිළිබඳ ඇගයීමක් කරන්න.

NWP-EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
පළමු වාර පරීක්ෂණය - 2020

| 13 ශ්‍රේණිය | නර්තනය I | පිළිතුරු පත්‍රය |
|---|---|---|

## I කොටස

1. 2
2. 3
3. 4
4. 1
5. 2
6. 3
7. 2
8. 2
9. 2
10. 4
11. 2
12. 5
13. 3
14. 4
15. 2
16. 3
17. 5
18. 2
19. 1
20. 2
21. 4
22. 2
23. 4
24. 1
25. 4
26. සන්නියකුම
27. රස නිශ්පත්තිය
28. භරත නාට්‍යම්
29. මුදුන්මාල
30. පරහඳගෑම
31. කිරිමඩුව
32. මැදුම් මහ දෙතිතට
33. කොට්ටබිස්ස
34. චූල වංශයේ
35. හංසා වන්නම
36. 1. ඊරියකා 2. සන්නියකුම
37. 1. ශුද්ධ මාත්‍රය 2. මාත්‍රා 3+4 (මැදුම් මහ දෙතිත)
38. 1. මහා වංශය 2. ප්‍රාග් බෞද්ධ යුගය
39. 1. ගමන් කරන 2. එකතැන
40. 1කර්ණාටක සංගීතය 2. මෘදංගය
41. 1. සදැස්මන් 16 2. ගීමත් 32
42. 1. එයාර් බ්‍රෂ් 2. පොස්තටික් මේක් අප්
43. 1. අංගුලියා පදය 2. තත් ජිත් තොං නං
44. 1. කොහොඹහැල්ල 2. කොහොඹාකංකාරිය
45. 1. වල්ලතෝල් නාරායන මෙනන් 2. රවීන්ද්‍රනාත් තාගෝර්
46. 1. ජානකී හීල් මහත්මිය 2. නෙලුම් පොකුණ
47. 1. ශිව ගිරි 2. සප්ත ගිරි
48. 1. නාට්‍ය ධර්මී නාට්‍ය 2. ලෝකධර්මී නාට්‍ය
49. 1. අංග රචනය 2. රංග වස්ත්‍රාභරණ
50. 1. භරතමුනි / නන්දිකේශ්වර 2. ඇරිස්ටෝටල් / ප්ලේටෝ

## II පත්‍රය - I කොටස

I

| 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දොං | - | ත | කු | දොං | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| + | + | බුද් | - | ධ | - | රා | - | - | - | ජ | - | ය | - |
| + | + | වැන් | - | දෙ | - | ප | - | ළ | - | මු | - | ව | - |
| + | + | දෙ | වෙ | නු | - | ස | - | - | ද් | බ | - | - | ර් |
| + | + | ම | ය | ව | - | දී | - | - | - | - | - | - | මි |
| ගි | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |

සංකේත භාවිතයට ලකුණු - 02 } ලකුණු 06
නිවැරදිව පද ප්‍රස්තාර කිරීමට - 04 }



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

| II | 1̂ | 2 | 1′ | 2 | 3 | 4 | 1̂ | 2 | 1′ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | + | + | ඉං | - | ත | - | ගු | - | තිත් | - | - | - |
| | - | - | තා | - | ඬි | - | ත් | - | තේ | - | - | - |
| | + | + | ජිං | - | ත | - | ගො | - | ජිං | - | - | - |
| | - | - | අ | ර | ජ | - | ත් | - | තේ | - | - | - |
| | - | - | - | - | - | - | - | - | - | - | - | - |

සංකේත භාවිතයට ලකුණු - 02
නිවැරදිව පද ප්‍රස්තාර කිරීමට - 04 } ලකුණු - 06

| III | 1′ | 2 | 3 | 4 | 1′ | 2 | 3 | 4 | 1′ | 2 | 3 | 4 | 1′ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | තත් | කඩ | තරි | කිට | ජි | ජි | කු | දි | තෙ | ජිං | ත | තෙ | ජිං | ත | කු | දි |
| | තෙ | ජිං | තත් | කඩ | ජිත් | කඩ | කඩ | තක | ගත් | - | ජිත් | - | + | + | කඩ | තක |
| | ත | ක | ජිත් | - | + | + | කඩ | තක | ත | කුං | - | ත | කුං | - | ජිත් | - |
| | ත | කුං | - | ත | කුං | - | ජිත් | - | ජි | ග | ත | කු | ත | ක | තෙ | ජිං |
| | තා | - | තත් | කඩ | ජිත් | කඩ | කඩ | තක | ජි | ග | ත | කු | ත | ක | තෙ | ජිං |
| | තා | | | | | | | | | | | | | | | |

සංකේත භාවිතයට ලකුණු - 02
නිවැරදිව පද ප්‍රස්තාර කිරීමට - 06 } ලකුණු - 08

මුළු ලකුණු - 20

02. (i) ආගමික පුද පූජා සඳහා බෙර වාදන, සන්නිවේදන කටයුතු සඳහා බෙර වාදන, රණබෙර වාදන ආදී විවිධ අවශ්‍යතා සඳහා බෙර වාදන යොදා ගත් බව සටහන් කර තිබීම.

- **ආගමික අවශ්‍යතා -**
  - රුවන්මැලි මහා සෑයේ ධාතු නිදානෝත්සවයට නානා විධ තූර්ය නාදයන් පැවැත් වූ බව
  - වසරක් පාසා අඛණ්ඩව මහබෝධිය බෝධි ස්නාන පූජා සඳහා පංචතූර්ය නාදය සහිතව වාදන පවත්වා ඇති බව,
- **සන්නිවේදන අවශ්‍යතා**
  - තේවා හේවිසි වාදන
  - රණ බෙර වාදන ............ පවත්වා ඇති බව

මහා බෝධියේ පවත්වනු ලැබූ තේවා හේවිසි වාදන දුටුගැමුණු රජ, එළාර රජු සමඟ සටනට ගිය ආකාරය පිළිබඳව විස්තර කෙරෙන තැන බෙර වාදනය සිදු කළ අයුරු .......
යනාදි කරුණු සහ වෙනත් සාධක තුලින් අනුරාධපුර යුගයේ විවිධ අවශ්‍යතා සඳහා බෙර වාදනය යොදාගන ඇති බවට සාධක දෙකක් ලියා තිබීම. (ල. 06)

(ii) සැස්සේරුව, සිතුල්පව්ව කොරවක්ගල හා පාල මොට්ටායි සෙල්ලිපි අයත් යුග පිළිබඳව දක්වා තිබීම.

- සැස්සේරුව හා කොරවක්ගල සෙල්ලිපි වල සඳහන් වන නළුවන් හා ඔවුන්ගේ දියණියවරුන් පිළිබඳව.
- එයින් කියැවෙන එකල නර්තන පරම්පරා පිළිබඳව සටහන් කිරීම.
- පරම්පරා තුලින් දේශීය නර්තන කලාව ඉදිරියට පවත්වා ගෙන ගිය බව
- පාල මොට්ටායි සෙල්ලිපියෙන් පිළඹිබු වන ආකාරය එකල දේශීය නර්තන කලාවට භාරතීය සංස්කෘතක ලක්ෂණ බලපා ඇති බවට

යනාදි කරුණු තුළින් සෙල්ලිපි වලින් පිළිඹිබු කෙරෙන නර්තන කලාව පිළිබඳ හැඳින්වීමක් කර ඇත්නම් (ල. 06)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(iii) පොළොන්නරු යුගයේ මහා පරාක්‍රමබාහු රජතුමාගේ සහ නිශ්ශංකමල්ල රජතුමාගේ පාලන කාලය සටහන් කර තිබීම.

- මහා පරාක්‍රමබාහු රජුගෙන් ලද රාජ්‍ය අනුග්‍රහය පිළිබඳව ලියා තිබීම.
- නැටුම්, ගැයුම්, වැයුම් පවත්වාගෙන යාම සඳහා ඉදිකරන ලද සරස්වතී මණ්ඩපය පිළිබඳ සටහනන් කර තිබීම.
- පරාක්‍රමබාහු රජුගේ බිසව වන රූපාවතී දේවියගෙන් සිදුවූ සේවය පිළිබඳව ලියා තිබීම.
- මෙම යුගයේ කුලවතුන් සමඟ දරුවන් නැටුමට යොමු කිරීම තුලින් නර්තන කලාවේ වර්ධනය සිදු වූ බවට සහ නිශ්ශංකමල්ල රජතුමාගේ කාලයේ
- කාලිංග උද්‍යාන ශිලා ලිපියේ සහ කාලිංග ක්‍රීඩා විනෝද ලිපියේ සඳහන් වන නර්තන කලාව පිළිබඳව සටහන් කිරීම.
- නිශ්ශංකලතා මණ්ඩපය ඉදිකර නර්තන කලාවට අනුග්‍රහය ලබා දීම.
- මෙතුමාගේ කාලයේ පවත්වන ලද ''බලි ශාන්තිකර්මය'' ආදී කරුණු තුලින් නර්තන කලාවට ලබා දුන් රාජ්‍ය අනුග්‍රහය පිළිබඳව සටහන් කිරීම. (ලකුණු 08)

(මුළු ලකුණු 20)

03. (i) සබරගමු ප්‍රදේශයේ ශාන්ති කර්ම අතරින් ගවපට්ටි සංරක්ෂණය හා ආරක්ෂාව උදෙසා පවත්වන ශාන්තිකර්මයක් බව

- ගව මහීෂාදීන්ට ඇති වන්නා වූ රෝග පීඩාදියෙන් මුදවා ගමේ සෞභාග්‍යය ළඟා කර ගැනීමේ අරමුණින් පවත්වන බව
- ගවයා කෘෂි කාර්මික ජන සමාජයට අත්‍යවශ්‍ය සත්වයෙකු බැවින්
  ගොවිතැනට සහය දීම, ජනතාව පෝෂණයට කිරි ලබා දීම, ප්‍රවාහන කටයුතු ඇතුළු කාර්‍යයන් රැසක් ගවයා විසින් ඉටු කිරීම නිසා අතීතයේ හින්දු සමාජයේ දේවත්වයෙන් සැළකීම සිරිතක් වූ බව
- මංගර දෙවි, පත්තිනි දෙවි ප්‍රධාන විෂ්ණු කතරගම, දැඩිමුණ්ඩ, ගොපලු කුරුම්බර, දොළොස් කුරුම්බර දෙවියන්ට පුද සෙත් දෙන බව

අරමුණු පැහැදිලි කිරීමට (ලකුණු 4)
දෙවිවරුන් නම් කිරීමට (ලකුණු 2)

(ii)

- ප්‍රථම දින පූජා චාරිත්‍ර ශ්‍රී දළදා මාළිගයේ සවස 6.00 ට පැවැත්වෙන තේවා වාදනය ආරම්භ වීමත් සමඟ ආරම්භ වන බව.
- පළමු දින සිට සත්වන දිනය දක්වා නියමිත විලාවන් අනුව තේවා හේවිසි වාදනය ආරම්භ වන බව
- පරහඳ ගෑමේ චාරිත්‍රය හැඳීන්වීම.
- ගවරවල වටා මඬුපුරය හා මල්හත් පදය පමණක් නර්තනය කරන බව
- කොහොඹාකංකාරිය ශාන්ති කර්මයේ නාට්‍යමය පෙළපාලි අතර වැදි යක්කම, නයායක්කම,මහා යක්කම රඟ දක්වන අතර, ඌරා යක්කම රඟ නොදක්වන බව.
- කාලියාම, ගරායකුන් නැටීම, ගුරුගේ මාලාව, ආවැන්දුමේ ''දොගරජංත'' වට්ටම, කීල බැඳීම චාරිත්‍ර වශයෙන් ඉදිරිපත් කරන බව

(චාරිත්‍ර 03 ක් නම් කර විස්තර කිරීමට ලකුණු 6)

(iii)

- හත් පද පෙළපාලිය නැටීමේ දී, කොතලය, දුම්මල කබල, කහදියර වළඳ ආදිය ද
- නානුමුරය නාට්‍යමය පෙළපාලිය සඳහා යොදාගන්නා උනුනු පියන හා ඊට අදාළ සබන් කෑල්ල,පනාව, තෙල් කුප්පිය, හවරිය ආදී............... උපකරණ
- කපුයක්කාරිය නාට්‍යමය පෙළපාලිය සඳහා යොදා ගන්නා කපුහේන, කපුගස, කපු යන්ත්‍රය, ඉද්ද, රොද්ද, වවුන්න, වෙල්ලිය, නඩාව, වලුකුර පෙට්ටිය ආදී.............උපකරණ
- චාමර පද නැටීමේදී චාමර යුගලද
- දරු නැළවිල්ල පෙළපාලියේ දී බෝනික්කකු හෝ දරු රුවක ආකෘතිය
- පැදුරේ දැපවිල්ල අවස්ථාව - පැදුර, වස්දණ්ඩ, අයිලේ තටු
- උඩු පියන් පාළියේ දී උඩු පියන
- කෙසෙල් බොඩ, ගොප්කොළ ආදී ස්වාභාවික අමුද්‍රව්‍ය යොදා විසිතුරු කැටයම් කර ඇති ආකාරය පැහැදිලි කිරීම.

කරුණු 04 ක් විස්තර කිරීම (ල. 08)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

**II කොටස**

04. (i)

- මල් බුලත් පුටුව සෑදීම.
- පුන් කලස් තැබීම, බුලත් කොළ තැබීම, මැටි පහන් දැල්වීම
- නව ග්‍රහයින් උදෙසා නියමිත නව කොළ අතු වලින් උඩු වියන අලංකාර කරන බව.
- මැස්සක් තනා හුඹස් මැටි වලින් බලිරූප අඹන බව.
- ඇතැම් බලි රෙදි කඩක චිත්‍රණය කරන බව
- ගුරුගල්, පොල්කටු අඟුරු, මකුලු මැටි හා ස්වාභාවික කොළ යුෂ ආදී පරිසරයේ අමුද්‍රව්‍ය ගෙන වර්ණ ගන්වන බව.
- අටමහල සකස් කිරීම, කඩතිර ඇදීම ආදිය විස්තර කිරීමට (ල. 06)

(ii) වෙස් මුහුණු වල විවිධත්වය හා වර්ණ භාවිතය

- පාලි, සන්නි, යක් නැටුම්, කුමාර පෙළපාලිය හැන්දෑ සමයම ආදී අවස්ථා සඳහා භාවිත රංග වස්ත්‍රාභරණ
- කළු යකාගේ - කළු අත්දිග බැනියම, කළු පිජාමව ආදී....
- සූනියම් යක්ෂණියගේ අවතාර තුන ...... සඳහා භාවිත රංග වස්ත්‍රාභරණ
- ඊරියකාගේ වස්ත්‍ර හා වෙස් මුහුණු රතු වර්ණය ආදිය ද
- ලිච්ඡවී රාජ චරිතය රාජ කුමාරයෙකු ලෙසින් දැක්වීම.
- පන්දම් පාළි, සළු පාළි .............. රංග වස්ත්‍රාභරණ
- මරු සන්නිය, වැදි සන්නිය,කෝල සන්නිය .......... ආදිය සඳහා රංග වස්ත්‍රාභරණ වෙස් මුහුණු .................
- යකැදුරන්ගේ චරිත නිරූපණය සඳහා ජීවය දෙන ආකාරය හා රංගවස්ත්‍රාභරණ නිර්මාණය සඳහා භාවිත අමුද්‍රව්‍ය පිළිබඳ කරුණු 03 ක් මගින්

විස්තර කිරීමට (ලකුණු 06)

(iii)

- සන්නියකුම ශාන්ති කර්මයේ දී චලන වලට ජීවය ලබා දීමට තාලය හා භාවාත්මක ගුණය ජනිත කරවීමට, නරඹන්නන්ගේ ආශ්වාදය ඇති කිරීමට, බෙර වාදනය ඉවහල් වන බව.
- යක්ෂ චරිත සභාගත කිරීම....
  ''දැහැමි දොං දොං ගතම්'' ආදී
- තුන් යාමයේ බෙර පද වාදනය
- ගායනය සඳහා බෙර පද වාදනය
- නර්තනය පාදක කරගත් වාදනය
- පූජාර්ථයෙන් කරන වාදන, නාට්‍යමය අවස්ථා හා බැඳී වාදන
- ගුප්ත බලවේග නිරූපණය හා බැඳී වාදන.......
  ආදී වාදන අවස්ථා පිළිබඳ විස්තර කිරීමට (ලකුණු 8)

05. (i) සෑම ගැමි නැටුමක් ම ආරම්භයේ දී බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නයෙන් හා දෙවියන්ගෙන් අවසර ගන්නා බව

උදා-: ''වරම් වරම් ඉර සඳ දෙවි.........''
''බෝ පත්තිනි මට අවසර දෙන්නේ..........''
''ඉරු දෙවියන්ගේ ඉරගල ගාවා......''

ආදී තොරතුරු ලියා ඇතිනම් .............. (ලකුණු 6)

(ii) ජස කෝලම - මෙම චරිතය තුළින් අඹු සැමි සබඳතා පිළිබඳ විග්‍රහ කෙරෙන බව

- සුරාවට ලොල් වූ විශාල උදරයක් සහිත චරිතයක් වන අතර, බිරින්දෑවරු තරුණ වයසේ පසුවන බව
- පවුල් සංස්ථාව තුළ ඇතිවන්නා වූ අනේක විධ ව්‍යාකූල තත්ව හමුවේ ජසයාගේ චරිතය ගොඩ නැගී ඇති බව.
- ඔහුගේ රාජකාරිය වුවද හරි හැටි ඉටු නොවන බව පෞද්ගලික ජීවිතයේ පැන නගින ගැටලු බාධාවන ආකාරය පෙන්වා දෙන්න.
  '' අප්පුහාමිලා මට සල්ලි නොදුන්නොත්
  තැබෑරුවේ තියා බොන්නම් රෙදි ටික''

ඔහුගේ බීමත්කම පිළිබඳ මෙම කවි නිදසුන් දෙමින් ලියා තිබීම.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

මුදලි - සමාජයේ උසස් යැයි සම්මත ප්‍රභූවරුන්ගෙන් සිදුවන අකටයුතුකම් පිළිබඳ විග්‍රහ වන බව

- අල්ලස් ගැනීම, නීතියට කටයුතු නොකිරීම, අසාධාරණ තීන්දු දීම, ස්ත්‍රී ලොල් බව ආදිය

නොංචි අක්කා -

- ගැමි කාන්තාවකගේ විලාස නිරූපණය කරයි
- වයස් ගත වුවද තරුණ බව පෙන්වීමට උත්සාහ දරණ බව
ඉහත කරුණු කවි ගායනා දෙබස් මගින් ඉදිරිපත් කර තිබීම. (ලකුණු 6)

(iii) **සමානතා**

- ඇදහිලි හා විශ්වාස මත පදනම් වී ඇති බව
- සාමූහිකව ඉදිරිපත් කිරීම.
- කාන්තා පුරුෂලෙස මිශ්‍රව ඉදිරිපත් කිරීම.
- කවි ගායනා යොදා ගැනීම.
- කාලානුකූල බව ආදී ලෙස තවත් උචිත කරුණු දක්වා තිබීම.

**අසමානතා**

- වාද්‍ය භාණ්ඩවල විවිධතා ඇතිබව
- රංග උපකරණවල විවිධතා තිබීම.
- ඇඳුම් පැලඳුම් වල විවිධතා තිබීම.

- ද්‍රවිඩ ආගමික හා සංස්කෘතික උත්සව අවස්ථාවන් හිදී ද්‍රවිඩ ගැමිනැටුම් යොදාගන්නා අතර සිංහල ගැමිනැටුම් විනෝදාස්වාදය සඳහා යොදා ගන්නා බව දක්වා ඇත්නම් (ලකුණු 8)

06. (i) (අ) රාස්ලීලා

- ක්‍රිෂ්ණ ඇදහීම මුල් කර ගෙන ඇති බව
- මණිපුරි දේශය බිහිවීම.
- රාජා කාර්තා රජු හා සම්බන්ධ කතා පුවත තුළින් විෂ්ණු දෙවියන් ඇදහීම හා සම්බන්ධව ඇති බව
- රවීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ දායකත්වයෙන් ප්‍රධාන නර්තන සම්ප්‍රදායක් ලෙස ස්ථාපිත වූ බව (ලකුණු 6)

(ආ) අට්ටියල්

චන්ද්‍රපිරෙයි, සූර්ය පිරෙයි, මුක්කුත්ති ...... ආදී ලෙස කොටස් නම් කර විස්තර කර ඇතනම් (ලකුණු 6)

(ඉ) නිදි කුමරිය

- මෙහි රංග රචනය මාරියස් පෙටීපාගේ බව.
- රොමැන්ටික් බැලේ ආකෘතියෙන් නිර්මාණය වූ බව
- 1850 දී ප්‍රථම වරට වේදිකා ගත වූ බව ආදී ලෙස ලියා ඇත්නම් (ලකුණු 08)

07. (i) චලනය, අවකාශය හා සම්බන්ධතා සංකල්පය පිළිබඳ විස්තර කිරීමට (ලකුණු 06)

(ii) භරතමුනි හා නන්දි කේෂ්වරයන් විසින් දක්වා ඇති මූල ධර්ම විස්තර කිරීමට (ලකුණු 06)

(iii)

- නර්තන වැඩ සටහන් නම් කිරීමට
- නර්තන නිර්මාණවල ස්වාභාවය හා උචිත බව සංගීතය, ගීතය, වාද්‍ය භාණ්ඩ, සංකලන යොදාගෙන ඇති බව
- පසුතල නිර්මාණ, වේදිකා ආලෝක වර්ණමත් කෙරෙන බව
- රංග වස්ත්‍රාභරණවල උචිත බව ආදිය තුළින් රසඥතා වර්ධනයට ඇති දායකත්වය විස්තර කර ඇත්නම්

නම් කිරීමට - ලකුණු 02
විස්තර කිරීමට - ලකුණු 04



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

08. (i) වර්ණ රේඛා හා හැඩතල පිළිබඳ හඳුන්වා ඇත්නම් (ලකුණු 06)

(ii) ගීත අනුව නර්තන සුසංයෝජනය, නූතන නර්තන නිර්මාණ වලදී, නව ප්‍රවණතාවක් වී ඇති බව
- එමඟින් මතු වූ ප්‍රබෝදය නිසා සමාජයම එයටහුරු වී ඇති බව.
- භාරතීය හා බටහිර සංගීතය අභාෂය බලපා ඇති බව (ලකුණු 06)
- 

(iii) නර්තන සම්ප්‍රදායන් පිළිබඳ අවබෝධය
(ශාස්ත්‍රිය/ ගැමි නැටුම්/ නිර්මාණ වශයෙනි)
- පුද්ගල සිරුරේ ස්වාභාවය හඳුනා ගැනීම.
- නර්තන චලන වලට උචිත ලෙස නිර්මාණය කිරීම
- වර්ණ භාවිතය පිළිබඳ සැළකිලිමත් වීම
(ද්‍රව්‍යය, වර්ණ හා ආලෝකකරණය)
- යොදා ගන්නා අමුද්‍රව්‍ය පිළිබඳ විස්තර කිරීම.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

WWW.LOL.LK

# BUY

## PAST PAPERS

## 071 777 4440

Buy Online - www.LOL.lk

- GCE O/L
- GCE A/L
- PAST PAPERS
- SHORT NOTES



Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

**ORDER NOW**

**075 699 9990**

**WWW.LOL.LK**

≡ LOL.lk
Learn Ordinary Level

0

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11 >
- Grade 06, 07 & 08 >
- Grade 04 & 05 >
- Grade 01, 02 & 03 >
- About Us >
- Shop HOT
- Cart

**HUGE SALE – SHOP NOW**




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

GCE O/L Exam




GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00




GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00




GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00